විවිධ

සම්මානිත හොවාරිය
කුසුමා කරුණාරත්න

ලෝකයේ වෙනත් බොහෝ සාහිත්‍යයන්හි මෙන්ම සිංහල සාහිත්‍යයේ ද එදා මෙදාතුර කැපී පෙනෙන අංගයක් ලෙස කවිය හැඳින්විය හැකිය. සරල ගැමි දිවියක් ගෙවූ අපගේ ගැමි ජනතාව මනහර ජනකවි නිර්මාණය කළේත්, ඒවා ගායනා කළේත් තම සංස්කෘතියට ආවේණික වූ සාහිත්‍ය අංගයකින් ලද පන්තරය ද මතු කර පෙන්වමිනි. කවිය වූ කලි සාහිත්‍යයෙහි අන්තර්ගත ප්‍රබල මාධ්‍යයකි. එදා මෙන්ම අද ද එය ප්‍රබල මාධ්‍යයකි. එදා මෙන්ම අද ද එය ප්‍රබල ප්‍රකාශන මාධ්‍යයක් ලෙස හැඳින්වීමෙහි ද වරදක් නැත.

කලාව, සාහිත්‍යය, කවිය නැතහොත් පද්‍යකාව්‍ය මිනිස් ජීවිතයට ඉතා සමීප වූත්, ඒ හා තදින් බඳුණා වූත් අංගයකි. කවිය මගින් ජනිත කෙරෙන රසය හා චමත්කාරය ගැන විද්වත් විචාරක මත බහුල වශයෙන් ප්‍රකාශයට පත් වී ඇත. පොදුවේ කලා නිර්මාණ ගැන සඳහන් කරමින් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර පවසන පහත දැක්වෙන අදහස් කවිය පිළිබඳව බෙහෙවින් අදාළ වන්නා වූත්, ඉතා වටිනා වූත් ඒවාය.

"ශ්‍රේෂ්ඨ යයි ගැනෙන හැම කලා නිර්මාණයක්ම ලෝකයෙහි පෙර නොවූ විරූ දෙයකි. එය අපූර්ව වස්තුවකි. එහෙයිනි, රසිකයා එය දැක කුල්මත් වන්නේ, මවිත වන්නේ, එය නිර්මාණ කළ තැනැත්තා සමාජයෙන් ගෞරව ලබන්නේ ද එම හේතුව නිසාය."
(කල්පනා ලෝකය, 9 පිට)

මෙයින් කියවෙන මුඛ්‍ය අදහස නම්, හැම ශ්‍රේෂ්ඨ කලා නිර්මාණයක්ම අපූර්ව වස්තුවක් බවයි. ලෝකයෙහි පෙර නොවූ විරූ දෙයක් ලෙස නිර්මාණ කරුවා විසින් ඉදිරිපත් කරනු ලබන එහි රසිකයා කුල්මත් කරවන, මවිත කරවන ස්වරූපයක් ඇත. එබඳු නිර්මාණ රසික සමාජය වෙත ඉදිරිපත් කරන කලාකරුවා සැබවින්ම සමාජ ගෞරවයට පාත්‍ර වන බව ද මෙහි දැක්වෙයි.

ලොව පෙර නොවූ විරූ, අපූර්ව වස්තුවක් සිය කලා කෘතිය මගින් නිර්මාණය කරන කලා කරුවා එමගින් සැබවින්ම අලුත් දෙයක්, අමුතු දෙයක් සමාජයට ඉදිරිපත් කරයි. මෙහිදී එම අපූර්වත්වය අපේක්ෂා කෙරෙනුයේ නිර්මාණ කරුවා සිය කෘතියට පාදක කරගන්නා විෂයයෙහි නොව එය ඉදිරිපත් කරන ආකාරයෙහිය. පැරණි සිංහල සාහිත්‍යයෙන් මේ පිළිබඳව ගත හැකි නිදසුන් අල්ප නොවේ. සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයෙහිදී ලියවුණ විශාල සංඛ්‍යාවක් වන සන්දේශ කාව්‍යවල සෑම එකකම පාහේ දක්නට ලැබෙන මග වැණුම්, සැඳෑ වැණුම්, උදා වැණුම් ආදියෙහිදී සොබාදහමේ සිදුවන එකම දේ නැතහොත් එකම අවස්ථාව නිරූපණය කරන්නට එම කවීන්ට සිදු විය. එහිදී ඔවුන් තුළ වූ නිර්මාණ ශක්තිය නිසා එකම සිදුවීම වුවත් වර්ණනයෙහිදී අපූර්ව ආකාරයෙන් ගෙන හැර දැක්වීමට ඔවුහු සමත් වී ඇත. නිදසුනක් ලෙස ගතහොත් සන්ධ්‍යා කාලයේදී බැස යන හිරු එක් කවියකු අතින් වර්ණනා වූයේ "පතඟන් අවර ගිරි නැටියෙන් වැටෙන කල - විලිකුන් සරත් පල වැනි වේ රිවි මඬල" යනුවෙනි. එනම්, රාත්‍රිය උදා වන්නට පෙරාතුව අවරගිරෙන් බැස යන හිරු දිස් වනුයේ හොඳට ඉදී, රත් පැහැ වූ පලයක් නැටිටෙන් ගිලිහී වැටෙන්නට ආසන්නව ඇතුවා සේය, යනුවෙනි. එම දර්ශනයම වර්ණනා කරන තවත් කවියකු එම අවස්ථාව තවත් අපූර්ව ආකාරයකට ගෙන හැර දැක්වූයේ, මුහුද පතුලේ තිබූ වඩබාග්නිය උඩට මතු වී ඇති ආකාරයක් වැනිය යනුවෙනි. මෙලෙසින් ගත් කල්හි ප්‍රතිභාපූර්ණ කවියා ඉන් පෙර කවියා තෝරාගත් මාතෘකා නැවත තෝරා ගන්නද, එය ඉදිරිපත් කරනුයේ පෙර නොවූ විරූ අපූරු ආකාරයකිනි.

මහාචාර්ය සරච්චන්ද්‍ර පවසන මෙම අපූර්ව නිර්මාණ සැබවින්ම ප්‍රතිභාපූර්ණ කවීන්ගේ කවිශක්තියෙන් ජනිත වන ඒවාය. එමෙන්ම සරච්චන්ද්‍ර මහතා දක්වන පරිදි, කවියකු නිර්මාණය කරන ලෝකය හුදෙක් මනඃකල්පිත, මායාරූපී දෙයක් නොවේ. කවියාගේ චිත්ත සන්තානයේ, සැබෑ ලෝකය, නැතහොත් යථාර්ථය පදනම් කොටගෙන කල්පිතයක් නිර්මාණය වීමකි. ඔහු මෙහිදී පැහැදිලි කරන අන්දමට ඉංග්‍රීසි බසින්, 'ඉමැජිනරි වර්ල්ඩ්' යන්න නොව 'වර්ල්ඩ් ඔෆ් ඉමැජිනේෂන්' යන්න මීට ගැළපෙන යෙදුමයි. ඒ අනුව, කවියක පදනම හා ඒ මත කෙරෙන නිර්මාණය රස දනවයි. එමගින් සහෘද මනස චමත්කාරයෙන් පුරවා ලයි. රසයේ හරය ලෙස චමත්කාරය සැලකීම මෙහිදී සැබවින්ම යෝග්‍ය බව කිව හැකිය.

සාමාන්‍ය ලේඛනයක, ඓතිහාසික තොරතුරු හෝ වෙනත් තොරතුරු ඇතුළත් වාර්තාවක පරමාර්ථය වනුයේ කියවන්නාට දැනුමක් ලබා දීමයි. පුවත් මගින් අධ්‍යාපනයක් ලබා දීමයි. එබැවිනි, එම පුවත් ඉදිරිපත් කරන කතුවරයා ඒ සියල්ල කෙළින්ම පවසනුයේ. එසේ වුවද, සාහිත්‍ය කෘතියක, පද්‍ය නිර්මාණයක සිදු වන්නේ සහෘද මනසෙහි රස ජනනය උදෙසා කෙරෙන නිර්මාණාත්මක කාර්යයකි. ඒ අනුව පොදුවේ ගත් විට කලාව, සාහිත්‍යය නිර්මාණාත්මක කර්තව්‍යයක් වෙයි.

කවියා හෝ අන් කවර සාහිත්‍ය කරුවකු වුව, ඇති දේ ඇසුරෙන් අලුත් යමක් මැවීම, නැතහොත් නිර්මාණය සිදු කරයි. මේ නිසාම නිර්මාණ කරුවන්, කවියන් ලෝක පාලකයන් ලෙස සැලකෙන බව සුප්‍රකට ඉංග්‍රීසි කවියකු වන ශෙලි පවසා ඇත. ඔහු දක්වන අන්දමට "කවියා වූ කලි ලෝකය නොපිළිගත්, ලෝකපාලකයෙකි." එනම්, රජකු හෝ වෙනත් පාලකයකු ලෙස සමාජය විසින් කවියා නම් කරනු නොලැබුවද කවියා සැබවින්ම, 'නිල නොලත්' ලෝක පාලකයෙකි. තවත් ලෙසකින් දැක්වුව හොත් කවියා, සාහිත්‍ය කරුවා නැතහොත් කලා කරුවා මහානුභාවසම්පන්න කෙනෙකි. එසේ විය හැක්කේ කෙසේද? කවියා තුළ ඇති නිර්මාණ කෞශලය, නිර්මාණ ශක්තිය, කවිත්වය නැතහොත් කවි ශක්තිය මගින් ඔහුට එම තත්වය හිමි වෙයි. කවියා සිය පරිකල්පන ශක්තියෙන් නව නිර්මාණ බිහි කරයි. ඒ සඳහා ඔහු තුළ වාසනා ගුණයක් ඇති බව පැහැදිලිය. අතීත අතට ගෙන බලන විට, හොඳ නිර්මාණයක් රස විඳිනයට සහෘදයා තුළ ද වාසනා ගුණයක් පිහිටා තිබිය යුතුය. සාහිත්‍ය කරුවකු තුළ තිබිය යුතු යයි සැලකෙන ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසය, එනම් සහජ කුසලතාව, බහුශ්‍රැතභාවය හෙවත් ඉගෙනීමෙන් ලබන දැනුම, මෙන්ම නිරතුරුව අභ්‍යාස කිරීමෙන් ලබන පුහුණුව එදා මෙදාතුර සිංහල කවියන්ගේ නිර්මාණ ඇසුරෙන් පැහැදිලි කරගත හැකිය.

විශ්වනාථ පැවසූ පරිදි, "රසය ආත්ම කොටගත් වාක්‍යය කාව්‍යයයි." (කාව්‍යං රසාත්මකං වාක්‍යං) මෙළෙසින් ගත් විට කවිය තුළ රසවත් බව අනිවාර්ය අංගයකි, ලක්ෂණයකි. විලියම් වර්ඩ්ස්වර්ත් සඳහන් කර ඇත්තේ, "කවිය, අනුත්සාහකව ගලා එන ප්‍රබල හැඟීම් දනවන්නක්" බවයි. ඒ අනුව, ප්‍රබල අත්දැකීම් විෂය කරගනිමින්, රසිකයාට ප්‍රබල විත්දනයක් ගෙන දෙවන පරිද්දෙන්, ප්‍රබලව ඉදිරිපත් කරන්නක් ලෙස කවිය ගැන තවදුරටත් පැහැදිලි කළ හැකිය. අදහස් ප්‍රකාශනයේ මෙම ප්‍රබල බව කවියක අත්‍යවශ්‍ය ලක්ෂණයකි. කාව්‍ය නිර්මාණයක ශබ්දයේ හා අර්ථයේ මනා සංකලනය ගැන අවධානය යොමු කළ රුදට එමගින් ගම්‍ය වන්නට සැලස්වනුයේ කවියක අර්ථයේත් ශබ්දයේත් වැදගත්කමයි.

මෙළෙසින් බලන විට කවිය හඳුන්වා දී ඇති බොහෝ විද්වතුන් පළ කළ පොදු අදහස් ලෙස එහි රමණීය බව, රසවත් බව, ප්‍රබල බව, ශබ්දයේ හා අර්ථයේ මනා සංකලනය, අනුත්සාහකව ගලා එන බව, මෙන්ම කවියක් තුළ හොඳම වචන, හොඳම පිළිවෙළට යොදා තිබීම ද විශේෂත්වයක් ගනී. සාර්ථක කාව්‍ය නිර්මාණයක උචිත වචන හා යෙදුම් මනාව ගළපාගෙන තිබීම එහි සාර්ථකත්වයට පාදක වන වැදගත් කරුණකි.

පොදුවේ ගත් කල්හි කවිය, ජීවිතය පිළිබඳව, ජීවිතය අඳලා ලියනු ලබන්නකි. සමාජය හා සමාජ අන්දැකීම් ඒවාට පාදක වෙයි. භාෂාව සුන්දර ලෙස යෝජනය කර ලියා තිබීම ද එහි වැදගත්කමට හා සාර්ථකත්වයට හේතු වෙයි. කවියකු සිය නිර්මාණ මගින් සමාජය වෙත කිසියම් බලපෑමක් කළ යුතුය යන්න ද පිළිගත හැකි තවත් වැදගත් කරුණකි. සමාජයක් යහමගට ගෙන යා හැකි නිර්මාණාත්මක ගුණයක් සාර්ථක කවියක අන්තර්ගත විය යුතුය. සංවේදී සමාජයක් බිහි කර ලීමට ද ප්‍රතිභාපූර්ණ කවියකුට හැකි විය යුතුය.

මෙවන් පසුබිමක සිංහල සාහිත්‍යය තුළ කවිය සැබවින්ම කැපී පෙනෙන්නකි. අෂ්ට අතීතයේ මෙරට ලේඛන කලාව යම් තරමක දියුණුව පැවතුණ මුල් අවදිවල පවා සමාජය තුළ පැවති සංවේදී බව, නිර්මාණාත්මක කුසලතා සහිත බව දැනගැනීමට අල්ප වශයෙන් හෝ සාධක හමු වෙයි. පොතපත රචනය හෝ මුද්‍රණය හඳුනාගෙන නොතිබුණ අෂ්ට යුගවලදී මෙරට සෙල්ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි ආදී වශයෙන් ගල් මත අකුරු කොටා රචනා කළ ලිපි අද පවා ඉතිරිව පවතී. ඒ අතර අතපැමි සෙල්ලිපිවල සඳහන් කාව්‍යාත්මක යෙදුම්, එදා විසූ ජනතාව තුළ වූ යම් පමණක හෝ නිර්මාණාත්මක හැකියාවන් විදහා දක්වයි.

ප්‍රකට වන සේ රචිත මෙබඳු ලේඛන අෂ්ට අතීතයේ පටන් මෙරට ජනයා සතුව තිබූ නිර්මාණාත්මක සම්පත් ලෙස දැක්විය හැකිය.

සිංහල සාහිත්‍යයේ තවත් නිර්මාණාත්මක ගී රචනා ලෙස ප්‍රකට සිගිරි ගී මගින් ද ඉගත දැක්වූ කවිය පිළිබඳ පැවසූ පොදු ලක්ෂණ අතුරෙන් සමහරක් හෝ විද්‍යමාන වෙයි. සිංහල සාහිත්‍යය තුළ මෙලෙස සැකෙවින් කළ නිර්මාණ පැවති අවදි පසු කොට දීර්ඝ කාව්‍ය සම්ප්‍රදායයන් කලින් කලට බිහි වී ප්‍රචලිත වී ආවේ ද පෙර කී පරිදි කවියක තිබිය යුතු ලක්ෂණ අඩුවැඩි වශයෙන් ප්‍රකට කරවමිනි.

සිංහල පද්‍ය සාහිත්‍යයේ කෙටි නිර්මාණ ලෙස, නිසඳැස් නම් කාව්‍ය සම්ප්‍රදාය බිහි කිරීමට පුරෝගාමී වූ ජී. බී. සේනානායක නිර්මාණ කරුවා එසේ පදනම දැමූ නිසඳැස් කාව්‍ය සම්ප්‍රදාය සෑහෙන කලක් තිස්සේ ජනප්‍රියව පැවති අතර සුපුරුදු පරිදිම වෙනත් කාව්‍ය රචනා සම්ප්‍රදායයන් ද සාහිත්‍යයට හඳුන්වා දුන් කවිකිවිදියෝ බොහෝ වූහ. මේ අතරතුර වර්තමානයේදී ජනප්‍රිය කාව්‍ය අංගයක් බවට පත් වී ඇති සැකෙවි කවි සම්ප්‍රදාය ද සැලකිය යුතු තත්වයක පවතී.

"අල්ලා බලන්න



"පියුම් පතැ දිය බින්දු ----"

නිදසුනක් ලෙස ගතහොත්, ශ්‍රී. පූ. දෙවන සියවසට අයිති ලෙස සැලකෙන කොස්ගම කන්ද ශිලා ලිපියෙහි ඇතුළත් වන කෙටි සඳහනකින් මේ බව ප්‍රකට වෙයි.

"මහ රසඛ ගමිණි . අඛයහ දෙවනපියශ
රමණි බරිය මිලකතිශ . විහරෙ කාරිතෙ කතිය"
(කොස්ගම කන්ද සෙල්ලිපිය)

කිව යුතු දේ ඉතා කෙටියෙන් දක්වන මෙහි ඇති සංක්ෂිප්ත බව එහි අරුත සමග රසයක් ද ජනිත කරවයි. "දෙවානම්පිය ගාමිණී අභය රජුගේ රමණීය බිරිය වූ කතිය බිසව විසින් මිලක්ඛතිස්ස විහාරය කරවන ලදී" යන දැන්වීම ඉතා කෙටියෙන් මෙන්ම සිත් කාවදින අයුරින් ද දක්වා තිබීම එහි රචකයා සතු කිසියම් කැසලතාවක් පිළිබිඹු කරයි.

මෙලෙසින් සිංහල සාහිත්‍යය සතු මුල්ම සාහිත්‍යමය සටහන් ලෙස ගත හැකි තවත් නිදසුනක් නම්, නවවන ශත වර්ෂයෙහිදී ලියවී යයි සැලකෙන, අභයගිරි විහාර භූමියෙන් හමු වී ඇති සෙල්ලිපියක ඇතුළත් වන, පැහැදිලි කවිත්වයක් ද දිස් වන, විශේෂත්වයකින් යුතු සෙල්ලිපි පාඨයකි.

"පියුම් පතැ දිය බින්දු
සෙයින් සක්විති ඈ සැපතුදු සසිලිල් සෙ සිතා
ලැවු ගිහි හමු ඉලිබු ලෙක්
සෙයින් දිවි මරණ හමු වන
සන්ඳ් එසෙඳ් සිතා ----------"
(අභයගිරි සෙල්ලිපිය)

මෙම ලිපි ඛණ්ඩය සැබවින්ම කාව්‍යමය ගුණයක් ප්‍රකට කරවයි. වක්‍රොක්තියෙන් තොරව, සාපු ලෙසට අදහස් ගෙන හැර දැක්වීමක් මෙහි ඇත. " ඈ සැප පියුම් පත දියබිඳු සේ වංචලය -------- " යනාදී වශයෙන් අරඹමින් ජීවිතය හා මරණය ගැනත් තරුණ බව ගැනත් කාව්‍යාත්මක අදහස් මේ ගිලිහුණු පියාපතෙහි
තවමත්
ගමනේ උණුසුම"
(තුන්පෙති හතර පස් පෙති - 17 පිට)

ඉතා සැකෙවින් පුළුල් අරුත් සමුදායක්, සුන්දර ලෙස රසික මනස තුළ චමත්කාරයක් දනවන සේ නිර්මිත මෙවන් සැකෙවි කවි කෙරෙහි වර්තමාන තරුණ කවිකිවිදියන්ගේ උනන්දුව ද යොමු වී ඇත.

"රාත්‍රිය ඉඩහරි
හැම නිවෙසකම
ඇතුළු එළියට"
(තුන්පෙති හතර පස් පෙති - 139 පිට)

සිංහල සාහිත්‍යයට නුහුරු, නුපුරුදු නොවන මෙවන් කාව්‍ය රචනා සම්ප්‍රදායයනට නව පණක් ලැබී තිබීම රසික ජනතාවගේ ප්‍රීතියට කරුණක් වනු නොඅනුමානය. සිංහල සැකෙවි කවි රචකයන් යම් තරමක් දුරට ජපන් හයිකු කාව්‍ය සම්ප්‍රදායයෙන් ද සාර්ථක ආභාසයක් ලබා ඇතැයි සිතිය හැකිය. එසේ වුවද ජපන් හයිකු කවි යනු ජපන් ජාතිකයන් ටම ආවේණික වූ, සැබවින්ම 'ජපන් බව' (ජපනීස් නස්) අන්තර්ගත කාව්‍ය සම්ප්‍රදායක් වන අතර සිංහල සාහිත්‍යයට යෝග්‍ය උක්ත සැකෙවි කවි රචනා කරනු විනා ඒවා 'හයිකු' ලෙස හෝ 'සිංහල හයිකු' ලෙස හෝ හැඳින්වීමට ගියහොත් එහි අරුත්සුන් බවක් ඇති වනු නොඅනුමානය.

ජපන් හයිකු කාව්‍ය ගැන උගන්නා බොහෝ දෙනා මුලින්ම කියවන හයිකු කවියක් නම්, 'මත්සුමු බෂො' නම් සුප්‍රකට ජපන් හයිකු කවියාගේ නිර්මාණයක් වන, මහාචාර්ය ආරිය රාජකරුණාගේ සිංහල පරිවර්තනයෙන් ඉදිරිපත් වන පහත දැක්වෙන කවියයි.

"ජරාවාස වූ පොකුණක